# මුතුබෙලි බිම්මලේ විසිතුරු කතාව



ඉනුකි ලිතුම්සා බණ්ඩාර

# මුතුබෙලි බිම්මලේ විසිතුරු කතාව

කතෘ :
ඉනුකි ලිතුම්සා බණ්ඩාර

ISBN No : 978-624-211-110-0
කෘතිය පළ කරන දිනය : 2026.05.10

5 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# පිළිගැන්වීම !

**මෙම නිරීක්ෂණ වර්ථාව මාගේ පන්තිභාර ගුරුතුමියටත්, පරිසර ළමා සමාජ භාරව සිටින ගුරුතුමියටත්, ගරු විදුහල්පතිනියටත් ආදරයෙන් පිළිගන්වමි.**





## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලූ දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


1. ව්‍යාපෘතිය හැඳින්වීම
2. ක්‍රමවේදය
3. නිරීක්ෂණය සහ නිගමන
4. ව්‍යාපෘතියෙන් ලද අත්දැකීම් සහ දැනුම
5. ව්‍යාපෘතිය අධ්‍යයනයේදී මුහුන පෑ ගැටළු හා ඒවා නිරීක්ෂණයට යොදා ගත් උපක්‍රම











ඔයිස්ටර් බිම්මල්

උද්භිත විද්‍යාත්මක නාමය

Pleurotus Ostreatu




කුලය

ප්ලිඹරටස්

Pleurotus




දිලීර විශේෂයකි

ආහාර සඳහා බහුලව

යොදා ගනියි




# ක්‍රමවේදය

ස්වාභාවික පරිසරයේ ඇති දිලීර නිරීක්ෂණය කිරීම ඉතා අපහසු බව මට වැටහිණ.එබැවින් ස්වාභාවික පරිසරයට සමාන තත්ත්ව යටතේ වර්ධනය වන බිම්මල් පැකැට්ටුවක් තෝරා ගැනීම සිදු කළ අතර එය නිරීක්ෂණය සිදු කළෙමි.

පළමුව බිම්මල් නිපදවන මාගේ යහළු නිවසකට ගොස් බිම්මල් මාධ්‍යය සකස් කරන අයුරු දැක ගතිමි. ඉන්පසු බිම්මල් බීජ දැමූ එක් පැකැට්ටුවක් ගෙදර ගෙනන ලදී. සති 06ක් පුරා බිම්මල් පැකැට්ටුවේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කළෙමි.






සතිය - 1

දිනය - 01

**බිම්මල් වගා මාධ්‍යය සකසා ගැනීම**


**ලීකුඩු, සහල් නිවුඩු, මුං පිටි, අළු සහ මැග්නීසියම් සල්ෆේට් මිශ්‍ර කර වගා මාධ්‍යය සකසා ගනී. ඉනුපසු එය පොලිතින් පැකැට්ටු වලට යොදා ජීවානුහරණය කර ගනී. එය සඳහා පහත උපකරණය යොදා ගනු ලබයි.**




දිනය - 02

**බිම්මල් බීජ ඇතුළු කිරීම**

**තම්බාගත් බිම්මල් පැකට් සිසිල් වූ පසු එයට බිම්මල් බීජ ඇතුළු කරනු ලැබේ. බිම්මල් බීජ කඩෙන් ලබා ගත යුතුයි. බිම්මල් බීජ යනු වැඩුණු බිම්මල් වලින් ඇතිවන බීජාණු වේ. (Spors) එය ඇතුළ කල පසු බිම්මල් පැකැට්ටුව හොඳින් වසා තිබිය යුතුයි.**




දිනය - 03

**පෙර බිම්මල් බීජ දැමූ පැකට් අඳුරු සිසිල් කාමරයක තැබුවා. කාමරයට හිරු එළිය නොවැටෙන සේ ජනෙල් වලට කළු පැහැති කොල ඇලවීම සිදු කළා.**



දිනය - 04

තෝරා ගත් කාමරය සිසිල් වුනත් එහි තෙතමනය රඳවා ගැනීමට මිලි ලීටර 500 ස්ප්‍රේ මැෂින් එකකින් මීදුමක් ආකාරයෙන් වතුර දැමීම සිදු කරා.



සතිය 02

දිනය - 05



බිම්මල් පැකැට්ටුවේ පුංචි සුදු පාට දිලීර සෑදී තිබුණා. මුළු බිම්මල් පැකැට්ටුවම සුදු පාට වෙලා. ඒ දිලීර ජාලයක්. ස්වභාවික පරිසරයේ තිබෙන ලොකුම ජාලය දිලීර ජාලයයි.

දිනය - 07



සෞම්‍ය දවසක්

බිම්මල් පැකැට්ටුවේ පොලිතින් දවටන නැති පැත්තෙන් පුංචි බිම්මල් පොහොට්ටු ඇවිල්ලා. ඒවා සුදුම සුදු පාටයි. ඒවා පොකුරු විදිහට ආවා. සවස ඒවා ලොකු වෙලා.

දිනය - 08

පුංචි බිම්මල් පොහොට්ටු ගොඩක් තිබුණා. මම ඒවා අණ්වීක්ෂය ආධාරයෙන් ලොකු කර බැලුවා.





දිනය - 09



බිම්මල් පොහොට්ටු ඉතා සෙමෙන් වර්ධනය වෙනු මම දැක්කා. මම හැමදාම වතුර විදිනයෙන් වතුර දැම්මා.

දිනය - 10

සෞම්‍ය දවසක්

කුඩා බිම්මල් ක්‍රමයෙන් ඉහළට එසවුනා. මෙම බිම්මල් සැදුනේ පොකුරක් විදිහට. මේ වගේ පොකුරු කිහිපයක් මට දැකගන්නට ලැබුණා.

බිම්මල් පොකුරක් →



දිනය - 11

වලාකුළු සහගත දවසක්

බිම්මල් පොකුරු ක්‍රමයෙන් ලොකු වුණා. බිම්මල් කඳ ඉහල ඇති තොප්පිය කොටස දිග ඇරෙන්නට වුණා.

එතකොට වෙනස් හැඩයෙන් සහ ප්‍රමාණයෙන් යුතු බිම්මල් තොප්පි මම දැක්කා.





දිනය - 12



හිරු එළිය වැඩි දවසක්

එක එක ප්‍රමාණයේ බිම්මල් මට හමුවුණා. සුදු පාටයි. මම බිම්මලක් ඇල්ලුවා. ඒවා සිනිඳුයි. තෙතමනය සහිතයි. සවස මම ඒවා ඇල්ලුවා. ඒවාගේ තෙතමනය අඩු වෙලා. මම ඒවාට වතුර දැමීම සිදු කළෙමි.

දිනය - 13





සෞම්‍ය දවසක්

බිම්මල් තොප්පි රවුම් සහ සුදු පාටයි. බිම්මල් තොප්පිය උඩ ලිස්සන ගතියක් තිබුණා.

බිම්මල් තොප්පිය අග රැලි ගතියක් පෙනෙන්නට තිබුණා.

**සතිය 03**

දිනය 14

බිම්මල් තොප්පිය යට රැලි තිබුණා. ඒවාට කියන්නේ තැලි කියලා. මෙම තැලි වල තමා කුඩා බීජාණු සෑදෙන්නේ.








බිම්මල් උඩ සහ යට

දිනය - 15



ගෙවත්තේ ඇවිදිද්දී මම දැක්කා බිම්මලක්. ඒ බිම්මල වටේටම සුදු පාට කුඩු වැටිලා. මේවා තමයි බිම්මල් බීජාණු (Spors) කියන්නේ. මේ බීජාණු වලින් අළුත් බිම්මල් හැදෙනවා.

දිනය - 16

බිම්මල් පොහොට්ටු ටිකෙන් ටික ලොකු වුනේ මේ විදිහටයි. බිම්මල් තොප්පියේ උඩ සහ යට වෙනස්කම් මම ෆොටෝ ගත්තා.



බිම්මල් වල යට කොටස



බිම්මල් වල උඩ කොටස

දිනය - 17

බිම්මල් ක්‍රමයෙන් ලොකු වුණා. බිම්මලේ යට පැත්තේ දාර පැහැදිලිව වෙන් වුණා. මම බිම්මලක් මැදින් කපලා ඇතුලේ තියෙන්නේ මොනවද කියලා බැලුවා. ඇතුල සුදුම සුදුයි.







දිනය -18





කෑමට ගන්නා බිම්මල්



කුඩා බිම්මල්

දැන් බිම්මල් හරිම ලොකුයි. මේ වේලාව කෑම සඳහා බිම්මල් කඩාගන්න පුළුවන්.



දිනය - 19



බිම්මල් පොකුරු කිහිපයක් මම අද කැඩුවා. එක පොකුරට එක තැනකින් ඇවිල්ලා. ඒ එක තැන බීජාණු වැටුණු නිසා වෙන්න ඇති. බිම්මල් ඇවිල්ලා.

දිනය - 20

වැඩුණු බිම්මල් කළු පාට රෙද්දක් උඩ තබා පොතකින් තද කලා. ටික වෙලාවකට පසු සුදු පාට ඇට වගේ දෙයක් කඩදාසියේ ඉතුරු වුණා. මේ තමයි බිම්මල් වල බීජාණු (Spors) බිම්මල් තිබුණු කාමරයට ගියාම මට කිවිසුම් ගියා. ඒ බිම්මල් බීජාණු නිසා. මේවා ඇදුම තියන අයට හොඳ නෑ.

බිම්මල් බීජාණු







තැලිවල සලකුණු

## සතිය 04

දිනය - 21

බිම්මල් දැන් ලොකුයි. තට්ටු කරාම යටින් පොඩි මීදුමක් වගේ ආවා. මේවා බිම්මල් වල බීජාණු (Spors) කියලා කියනවා.
මේ දුම වගේ දෙය නාසයට යන්න හොඳ නෑ කියලා අත්තම්මා මට කියලා දුන්නා.
මේ බීජාණු වලින් අළුත් බිම්මල් පැළ ඇති වෙනවා. මේවා ව්‍යාප්ත වෙන හැටි මම අන්තර්ජාලයෙන් කියෙව්වා. ඒවා ව්‍යාප්ත වන්නේ,

- සුළඟින්
- ජලයෙන්
- සතුන්ගෙන්







දිනය - 22

මට මගේ බිම්මල් පැකැට්ටුවේ බීජාණු හැදෙනවද කියලා බලාගන්න ඕනේ වුණා. මම උදේම මගේ බිම්මල් පැකැට්ටුවක් සිරස් අතර කළු පාට රෙද්දක් උඩ තිබ්බා. සවස් වෙනකොට රෙද්දේ සුදු පාට බීජාණු තිබුණා.





දිනය - 23

අද කඩපු බිම්මල් දෙකක් එකට ඇලිලා තිබුණා. ඒවා දාර වලිනුයි ,
මුලෙනුයි එකට ඇලිලා.



දිනය - 24

- බිම්මලේ පරවීම

දූන් බිම්මල් ලොකුයි. ඒවා හැකිලෙන්න පටන් අරගෙන
දාර රැලි වැටිලා පිටි වගේ තිබුණා. සුදු පැහැය අඩුවෙලා තිබුණා.

දිනය - 25

වියළි කාළගුණයක්
බිම්මල් තවත් රැලි වැටිලා, හැකිලිලා.
සුදු පාට පුල්ලි ගොඩක් ඇවිල්ලා.
දූන් බිම්මල් වේලෙන ගතියක් පෙන්වනවා.





## සතිය 05

දිනය - 26/27

වැසි දිනයක්

දැන් බිම්මල් හොඳටම හැකිලිලා. වේලෙන්න පටන් අරගෙන.
සමහරක් බිම්මල් වල යටි පැත්තේ පුංචි සත්තු ඇවිදිනවා මම දැක්කා.











## සතිය 06

දිනය - 27

එක බිම්මලක් සත්තු කාලා. පාටත් වෙනස් වෙලා.
චූටි සත්තු බිම්මලේ තැලි අතර ගමන් කරනවා. ඒ කට්ටියට රස කෑමක් හම්බ වෙලා වගේ.



දිනය - 28

ඉර එළිය සහිත දවසක්





කැඩුණු බිම්මල්



හැකිලෙන බිම්මල්





පාට වෙනස් වුණු බිම්මල්

දිනය - 29

වැසි දවසක්

බිම්මල් තවත් හැකිලෙනවා, හොඳටම වේලෙනවා. සත්තු කාපු නැති බිම්මල් දුඹුරු පාට වෙලා. දාර තද දුඹුරු පාටයි. සමහර බිම්මල් හැකිලෙනකොට රැලි තියෙන තැන් වලින් කැඩිලා වගේ තිබුණා.





දිනය - 30



අව්ව සහිත දවසක්

බිම්මල් දැන් වේලිලා. දුඹුරු පාට වැඩියි.

බිම්මල් වන දිලීර වලින් ඇති ප්‍රයෝජන මම සොයාගත්තා.

- බිම්මල් ආහාර ලෙස ගන්නවා. ඒවාගේ ප්‍රෝටීන් හා ඛනිජ ලවණ බහුලයි.
- ආප්ප පිපෙන්න දාන යීස්ට් දිලීරයක්. චීස් හදන්නෙත් දිලීර වලින්
- මියගිය ශාක හා සතුන් දිරාපත් කිරීමට දිලීර උදවු වෙනවා.
- දිලීර වලින් ඖෂධත් හදනවා.


දිනය - 31



බිම්මල් හැකිලිලා දැන් හොඳටම චූටියි. ඒවා වේලිලා. දැන් ඒවාගේ පාට තද දුඹුරු , අළු පාටයි. අළු පාට තියෙන්නේ පුස් කියලා අම්මා කිව්වා. දැන් බිම්මල මැරිලා.

දිනය - 32

බිම්මලක කොටස්




දිනය - 33



බිම්මල් පොකුරු පරවෙද්දි තව බිම්මල් ආවා. ඒ ආවේ පරවෙච්ච බිම්මලේ බීජාණු වලින් වෙන්න ඇති.

- දිලීර වලින් ඇතිවන අවාසි
  - මිනිසුන්ට සහ ශාකවලට රෝග ඇති කිරීම
  - ආහාර නරක් වීම හා විෂ වීම
  - තෙතමනය සහිත බිත්ති, ලී වල පුස් සෑදීම

සතිය 07

දිනය - 34

දිලීරයක් මත දිලීරයක්

එක බිම්මල් පොකුරක් පරවෙලා ගියාට තවත් බිම්මල් පොකුරක් හටගත්තා. එක බිම්මලක කළු පාට තිත් වගේ ජාතියක් තිබුණා. ඒවා තමයි පුස් කියලා කියන්නේ. ඒවත් දිලීර.



දිනය - 35

සෞම්‍ය දවසක්



ගෙවත්තේ කොළ ගොඩක් උඩ සුදු පාට ලස්සන බිම්මල් ගොඩක් පිපිලා තිබුණා. බිම්මලේ තොප්පි අහස පැත්තට හැරිලා තිබුණා. ඒකට හේතුව මොකක්ද? ඒවා අව්ව හොයාගෙන යනවද?

<u>විශේෂිත නිරීක්ෂණය 01</u>

දිනය - 36

හිරු එළිය සහිතයි



බිම්මල් හැම වෙලාවෙම අහස දෙසට හැරෙනවා. ඉස්සෙල්ලා මම බිම්මල් පැකැට්ටුව තිබ්බේ තිරස් අතට, එතකොට බිම්මල් තොප්පය අහස දෙසට හැරුණා. මේ පාර මම බිම්මල් පැකැට්ටුව සිරස් අතට තිබ්බා. එතකොට බිම්මල් තොප්පිය අහසට හැරිලා තිබුණා.

<u>විශේෂිත නිරීක්ෂණය 02</u>

දිනය - 37

තෙත සහිත දිනයකි



බිම්මල් පැකැට්ටුව තිරස් අතට තියෙද්දී මේසේ අයිනට වෙන්න තියලා තියෙන්නේ. බිම්මලට හැදෙන්න ඉඩ මදි වෙලා. ඒක හින්දා ඒක නැමිලා. දිලීරයකටත් හැදෙන්න ඉඩ ඕනේ.

දිනය - 38



- විවිධ බිම්මල් වර්ග

  ගෙවත්තේ ඇවිදින විට එකිනෙකට වෙනස් බිම්මල් මම දැක්කා. මම ඒවාගේ ඡායාරූප ගත්තා. සමහර බිම්මල් ගස්වල හැදිලා තිබුණා. සමහර පුස් වර්ග කෑම වල හැදිලා තිබුණා.





බිම හටගත් බිම්මල්



පොල් මදයේ පුස් සෑදීම



ගසක කඳක හටගත් බිම්මල්




රටකජු පුස්කෑම

පාන් කැබලි වල පුස් කෑම



දිනය - 39

<u>බිම්මලේ ජීවන චක්‍රය</u>



## බිම්මලේ ජීවන චක්‍රය




## නිගමනය

01.) ඔයිස්ටර් බිම්මල් යනු වැඩුණු දිලීරයකි.

02.) මෙම දිලීර ස්වාභාවික පරිසරයේ මෙන්ම අප විසින් සාදනු ලබන වගා මාධ්‍යයක වගා කළ හැකි බව තේරුම් ගැනීම

03.) මෙම බිම්මල් ක්‍රමයෙන් වර්ධනය වී තම ජීවන චක්‍රය සම්පූර්ණ කරන බව

04.) සමහරක් දිලීර අපගේ ආහාර නරක් වීමට බලපාන බව තේරුම් ගැනීම

## ව්‍යාපෘතියෙන් ලද අත්දැකීම් සහ දැනුම

01.) අප ආහාරයට ගන්නා ඔයිස්ටර් බිම්මල් වගා කරන ආකාරය ගැන ඉගෙන ගැනීම

02.) බිම්මලේ ජීවන චක්‍රය සිදු වන ආකාරය නිරීක්ෂණය කළෙමි.

03.) බිම්මලක කොටස් සහ විවිධ වර්ධන අවධි දැක ගතිමි

04.) එකිනෙකට වෙනස් දිලීර වර්ග ගැන අවබෝධයක් ලබා ගිතිමි.

05.) ඉවසීමෙන් සහ හොඳින් නිරීක්ෂණය කිරීමෙන් තොරතුරු ලබා ගත හැකි බව ඉගෙන ගැනීම.

## ව්‍යාපෘතිය අවසානයේදී මුහුණ පෑ ගැටළු හා ඒවා නිරාකරණයට යොදා ගත් උපක්‍රම

01.) බිම්මල් වර්ධනයට දැඩි ආලෝක අහිතකර වීම නිසා සමහරක් බිම්මල් විනාශ වුණා. එම නිසා බිම්මල් අඳුරු පරිසරයක තැබිය යුතු බව තේරුම් ගතිමි.

02.) බිම්මල් සඳහා තෙත අවශ්‍ය මානය අවශ්‍ය බව හඳුනා ගතිමි.
දිනපතා වතුර නොදැම්මොත් බිම්මල් විනාශ වන බව නිරීක්ෂණය කළෙමි.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN No : 978-624-211-110-0**